www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**ඇමරිකා එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ සම්මේලනයේ සම්මත වූ යෝජනා**

**Resolution of the Socialist Equality Party Congress**

# ලියොන් ට්‍රොට්ස්කි ඝාතනයේ 70 වෙනි සංවත්සරය පිලිබඳව

## On the Seventieth Anniversary of the Assassination of Leon Trotsky

**2010 අගෝස්තු 20**

*ඇමරිකා එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂය මිචිගන් ප්‍රාන්තයේ ඈන්ආබර්හි දී තම ප්‍රථම නිත්‍ය ජාතික සම්මේලනය 2010 අගෝස්තු 11-15 දිනයන්හි දී පැවැත්විය. ඉදිරි සතිවල දී ලෝක සමාජවාදී වෙබ් අඩවිය මෙම සම්මේලනයේ යෝජනා හා වාර්තා පල කරනු ඇත. අප අද පලකරන්නේ සම්මේලනයේ ප්‍රථම දින ඒකමතිකව සම්මත කර ගත් "ලියොන් ට්‍රොට්ස්කි ඝාතනයේ 70වන සංවත්සරය පිලිබඳව" යන යෝජනාවයි.*

★★★

1917 ඔක්තෝබර් විප්ලවයේ සහ-නායකයා වූ ද හතරවන ජාත්‍යන්තරයේ සමාරම්භකයා වූ ද ලියොන් ට්‍රොට්ස්කි 1940 අගෝස්තු 21 වන දා සෝවියට් සංගමයේ ස්ටැලින්වාදී තන්ත්‍රයේ ඒජන්තයෙකු විසින් එල්ල කරන ලද ප්‍රහාරයකින් ලත් තුවාලවලින් මරනයට පත්විය. ඔහුගේ ඝාතනය 1917 ඔක්තෝබර් විප්ලවය සූදානම් කලා වූ ද එයට නායකත්වය සැපයුවා වූ ද ප්‍රථම කම්කරු පන්ති රාජ්‍යයේ අත්තිවාරම නිර්මානය කලා වූ ද සමාජවාදී කම්කරුවන් හා බුද්ධිමතුන් සමස්ත පරම්පරාවකට ම එරෙහිව ස්ටැලින්වාදී නිලධාරී තන්ත්‍රය විසින් එල්ල කරන ලද දේශපාලන ජනඝාතක මෙහෙයුමක කූටප්‍රාප්තිය සලකුනු කලේ ය. ස්ටැලින්ගේ භීෂනය 20 වන ශතවර්ෂයේ දරුනුම අපරාධයන්ගෙන් එකකි.

ඔහුගේ අභාවයෙන් අවුරුදු 70 ට පසුව ද ට්‍රොට්ස්කි නිර්දය මුසාකරන සහ අවලාද මෙහෙයුමක ඉලක්කයව පවතී. ප්‍රමුඛ ග්‍රන්ථ ප්‍රකාශකයින් විසින් ට්‍රොට්ස්කි අවමානයට පත් කිරීම සඳහා කැපවුනු වෙලුම් පිට වෙලුම් නිරන්තරයෙන් නිෂ්පාදනය කරනු ලැබේ. බුද්ධිමය හෝ සදාචාරාත්මක සංයමය මුලුමනින්ම ඉවත දමා ඇති ශාස්ත්‍රාලගත බකපන්ඩියෝ දුෂ්ටම කෙටේරි කෘතිය නිෂ්පාදනය කල හැක්කේ කාට ද යන්න පිලිබඳව තරගයක යෙදී සිටිති. එහෙත් ලියොන් ට්‍රොට්ස්කි ලෝක ඉතිහාස තුල අත් කර ගෙන සිටින්නාවූ අත්‍යසමාන්‍ය ස්ථානය පහත හෙලීමට මොවුන්ගේ සකල විකෘති කන්දරාවට ම කල නොහැකිව ඇත. ට්‍රොට්ස්කි දැවැන්ත ස්ථම්භයක් ලෙස නැගී සිටී. ඔහු තම මුලුමහත් ජීවිත කාලයම යෙදවූවා වූ ද අන්තිමේදී දිවි පිදුවා වූ ද අදහස් සහ මූලධර්මයන් ගේ නිවැරදිභාවය 1940 ඔහුගේ ඝාතනයෙන් මොබ ඓතිහාසික වර්ධනයේ සමස්ත ගමන්මග විසින් සනාථ කරනු ලැබ ඇත.

1923 වාමාංශික විරුද්ධ පක්ෂය පිහිටවූ ට්‍රොට්ස්කි සෝවියට් නිලධරය වැඩී ඒමට ද එහි දේශපාලන බලය අල්ලා ගැනීමට ද එරෙහිව අරගලයට මුල පිරුවේය. තනිරටේ සමාජවාදය පිලිබඳ ප්‍රතිගාමී ස්ටැලින්වාදී වැඩ පිලිවෙලට එරෙහිව ට්‍රොට්ස්කි මාක්ස්වාදී ජාත්‍යන්තරවාදී මූලෝපාය සහ මූලධර්මයන් ආරක්ෂා කලේ ය. සෝවියට් කම්කරු පන්තිය ද ජාත්‍යන්තර කම්කරු පන්තිය ද යන දෙකට ම ස්ටැලින්ගේ පිලිවෙත් විසින් අත් පත් කර දෙනු ලබන ව්‍යසනකාරී විපාකයන් මොනවා ද යන්න ඔහු කල් තබාම පෙර දුටුවේ ය. වාම විපාර්ශවය 1923 හා 1933 අතර සමයේ සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය ද තුන්වන ජාත්‍යන්තරය ද ස්ටැලින්වාදයෙන් මුදා 1917 ඔක්තෝබර් විප්ලවයට පදනම සැපයුවා වූ සැබෑ බොල්ශෙවික්වාදී ක්‍රියාමාර්ගයට පෙරලා ගෙන ඒමට සටන් වැදුනි. එහෙත් ස්ටැලින්වාදීන්ගේ විනාශකාරී පිලිවෙත 1933 ජර්මනියේ දී ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනයට මග පෑදූ පසු ට්‍රොට්ස්කි හතරවන ජාත්‍යන්තරය ගොඩනැගීමට කැඳවුම් කලේ ය. සෝවියට් සංගමය විනාශයෙන් ගලවාගත හැක්කේ කම්කරු පන්තිය දේශපාලන විප්ලවයකින් ස්ටැලින්වාදී නිලධාරී තන්ත්‍රය පෙරලා දැමීම මගින් ම පමනකැයි ට්‍රොට්ස්කි අනතුරු හැඟවිය. සෝවියට් නිලධරය ධනවාදය යලි පනගැන්වීමට අනුග්‍රහය දක්වනු ඇතැයි ට්‍රොට්ස්කි තරයේ කියා සිටියේ ය. ට්‍රොට්ස්කි නිවැරදි බව ඔප්පු විය.

ස්ටැලින්වාදයට විරුද්ධව ට්‍රොට්ස්කි ගෙන ගිය අරගලය පදනම් කරන ලද්දේ ලෝක සමාජවාදී විප්ලවයේ මූලෝපාය මත ය. මෙම මූලෝපායේ ඉහලම අර්ථභාරී ඓතිහාසික ප්‍රකාශනය වූයේ 1938 සැප්තැම්බරයේ දී හතරවන ජාත්‍යන්තරය පිහිටුවීම යි. හතරවන ජාත්‍යන්තරයේ කාර්යධරයන්ගෙන් පිටස්තරව, "විප්ලවවාදී ධාරාවක් යයි නම් කිරීමට වටිනා වෙනත් කිසිදු ප්‍රවනතාවක් ඇත්තේ නැත"යි හතරවන ජාත්‍යන්තරය සඳහා සම්පාදනය කල ආරම්භක ලියවිල්ලේ ට්‍රොට්ස්කි ප්‍රකාශ කලේ ය. එහෙත් ට්‍රොට්ස්කිගේ මෙම ප්‍රකාශය ජනතාව අතර කලින් කලට බලපෑම් සහිත තත්වයන්ට පැනගත් විවිධ දේශපාලන සංවිධාන සහ ව්‍යාපාරවලට විප්ලවවාදී සහතිකයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමක් ලෙස දැකගත් ගනන් නැති මාධ්‍යමික හා අවස්ථාවාදී ප්‍රවනතාවන්ගේ ඉමහත් කෝපයට ලක්විය. එහෙත් යලිත්වරක් නිවැරදි යයි සනාථ කරනු ලැබුවේ ට්‍රොට්ස්කිම ය. අවස්ථාවාදීන් විසින් මහ ඉහලින් තක්සේරු කෙරුන තීරනාත්මක දේශපාලන ප්‍රවනතාවන්ට අද සිදුව ඇත්තේ කුමක් ද ?

පැබ්ලෝ, මැන්ඩෙල් සහ ඔවුන්ගේ සහකරුවෝ 1953 ස්ටැලින්ගේ මරනයෙන් ඉක්බිත්තේ ක්‍රෙම්ලිනයේ තාප්ප මැදින් නව මාක්ස්වාදයක් පනගැන්වී ඉස්මත්තට ඒමේ මහා ශක්‍යතාවයක් දුටුවහ. සමාජවාදී විප්ලවයේ නව රැල්ලක් සඳහා උත්තේජකය ස්ටැලින්ගේ අනු ප්‍රාප්තිකයන් අතින් සැපයෙනු ඇතැයි යන සංකල්පය වටේ ඔවුහු සමස්ත න්‍යායක්ම ගොඩනැගුහ. සෝවියට් සංගමය බිඳ වැටෙන තුරු ම ක්‍රෙම්ලිනයෙන් අනුමත වූ දේශපාලන ගැලවුම්කරුවකුගේ ආගමනය පැබ්ලෝවාදීහු බලා සිටියහ. අන්තිමේ දී අර්නස්ට් මැන්ඩෙල් ගොර්බචෙව් තුලින් ද තාරික් අලි බෝරිස් යෙල්ට්සින් තුලින් ද තම ගැලවුම්කරුවා සොයාගත්හ. එහෙත් මේ "ගැලවුම්කරුවන්" අත් කර දුන්නේ සමාජවාදය නොවේ ධනවාදය ව්‍යසනකාරී ලෙස යලි පිහිටුවීමකි.

පැබ්ලෝවාදීන් ද අනෙකුත් වාම බුද්ධිමතුන් ද ට්‍රොට්ස්කිවාදය වෙනුවට සොයාගත් ආදේශකයන් අතර මාවෝ, ටිටෝ, නසර්, බෙන්බෙලා හා කැස්ට්‍රෝ ද සැන්දිනිස්ටා සහ අප්‍රිකානු ජාතික කොංග්‍රසය විසින් නායකත්වය දෙනු ලැබූ ව්‍යාපාර ද ලෝක දේශපාලන කරලියේ ටික කලකට හෝ දිගු කලකට ප්‍රමුඛ ස්ථානයක් දිනා ගත් තවත් ගනන් නැති ජාතිකවාදී නිර්මිතයන් ද විය. මේ සියල්ල අද දේශපාලන සුසානයට ගොසිනි. මේ සෑම ව්‍යාපාරයක් ම හුදෙක් අසමත්වූවා පමනක් නොවේ; මහජනතාවගේ විප්ලවවාදී අරගලයන් පාගාදැමීමේ ලා ලෝක ධනේශ්වරයේ සැබෑ හවුල්කාරයන් ද වූහ.

ආරක්ෂාව සහ හතරවන ජාත්‍යන්තරය පිලිබඳ පරීක්ෂනය මගින්, ස්ටැලින්වාදීන් ලියොන් ට්‍රොට්ස්කි ඝාතනය කිරීමට කල කුමන්ත්‍රනයේ දිගුකලක් තිස්සේ වසන්කර තිබුනු තීරනාත්මක අංශ එලිදරව් කිරීමට තමන් 1970 ගනන්වල සහ 80 ගනන්වල දී ඉටු කල භූමිකාව පිලිබඳව සමාජවාදී සමානතා පක්ෂය යුක්තිසහගතව ආඩම්බර වෙයි. මෙහි ලා විශේෂයෙන් වැදගත් වූ ප්‍රතිපදානයක් නම් ට්‍රොට්ස්කිගේ ජීවිතයට එරෙහි කුමන්ත්‍රනයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ සමාජවාදී කම්කරු පක්ෂය තුල කටයුතු කරමින් සිටි ස්ටැලින්වාදී ඒජන්තයන් විසින් ඉටු කරන ලද ක්‍රියාකලාපය එලිදරව් කිරීම ය. මෙම පරීක්ෂනය කරන ලද්දේ ස්ටැලින්වාදී සංවිධාන සමග පෙලගැසී සිටි පැබ්ලෝවාදී සංවිධාන වල දරුනු විරුද්ධත්වයට මුහුන දෙමිනි. කෙසේ වෙතත් හතරවෙනි ජාත්‍යන්තරයේ ආරක්ෂාව පිලිබඳව කරන ලද පරීක්ෂනය තුල දී ද ඉන් ඉක්බිතිව සෝවියට් සංගමයේ ස්ටැලින්වාදී තන්ත්‍රය විසුරුවා ලීමෙන් පසුව කරන ලද පරීක්ෂන වලදී ද සොයාගන්නා ලද ලියවිලි ජාත්‍යන්තර කොමිටියේ වැඩකටයුතු සනාථ කලේ ය.

සමාජවාදී සමානතා පක්ෂය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අපගේ සහෝදරවරුන් සමග අතිනත් ගනිමින්, ලියොන් ට්‍රොට්ස්කි සටන්කලා වූ න්‍යායික සංකල්පයන් ද ක්‍රියාමාර්ග හා මූලධර්මයන් ද දිගු කලක් තිස්සේ ආරක්ෂා කිරීම පිලිබඳව ආඩම්බර වෙයි. මෙම 70 වෙනි සංවත්සරයේදී ඉතිහාසය මුසාකරනය කරන්නන්ගේ බොරු එලිදරව් කොට ඛන්ඩනය කරමින් ඩේවිඩ් නෝර්ත් සහෝදරයා විසින් කරන ලද දේශන මාලාවක් සහ ලිපි අන්තර්ගත කර ගත් ඉන් ඩිෆෙන්ස් ඔෆ් ලියොන් ට්‍රොට්ස්කි (ලියොන් ට්‍රොට්ස්කි ආරක්ෂා කිරීම) නම් කෘතිය පලකිරීම අතිශයින්ම අදාල යැයි අපි සලකමු.

ලෝක ධනවාදයේ ගැඹුරුවන්නා වූ අර්බුදය පන්ති අරගලය යලි පන ගැන්වීමක් කරා ගමන් කරත්ම ලෝක සමාජවාදී විප්ලවයේ විශිෂ්ටතම මූලෝපායඥයා වූ එල් ඩී ට්‍රොට්ස්කිගේ අදහස් කම්කරුවන්ට සහ තරුනයින්ට හඳුන්වාදීම සඳහා තමන් ගෙනයන අරගලය තියුනු කිරීමට සමාජවාදී සමානතා පක්ෂය සපථ කර සිටී.

© www.wsws.org